# පඨමො පාඨො

යො කප්පකොටීහිපි අප්පමෙය්‍යං
කාලං කරොන්තො අතිදුක්කරානි,
ඛෙදං ගතො ලොකහිතාය නාථො
නමො මහාකාරුණිකස්ස තස්ස.

අසම්බුධං බුද්ධනිසෙවිතං යං
භවාභවං ගච්ඡති ජීවලොකො
නමො අවිජ්ජාදිකිලෙසජාල
විද්ධංසිනො ධම්මවරස්ස තස්ස.

ගුණෙහි යො සීලසමාධිපඤ්ඤා
විමුත්තිඤාණප්පභුතීහි යුත්තො
ඛෙත්තං ජනානං කුසලත්ථිකානං
තමරියසඞ්ඝං සිරසා නමාමි.

(සමන්තපාසාදිකා)

පදමාලාව

| | | | |
|---|---|---|---|
| කප්පකොටීහි'පි | (ස) | - | කල්ප කෝටියකිනුත් |
| අප්පමෙය්‍යං | (ස) | - | ප්‍රමාණ කළ නොහැකි |
| කරොන්තො | (කි) | - | කරන්නේ |
| අතිදුක්කරානි | (ස) | - | ඉතා දුෂ්කර වූ |
| ඛෙදං | (නා) | - | සංවේගයට |
| ගතො | (කි) | - | ගිය |
| ලොකහිතාය | (ස) | - | ලෝකයාට හිත පිණිස |
| නාථො | (නා) | - | පිහිට වූ |
| මහාකාරුණිකස්ස | (ස) | - | මහාකාරුණිකයන් වහන්සේට |
| අසම්බුධං | (කි) | - | මැනවින් අවබෝධ නොකළ |
| බුද්ධනිසෙවිතං | (ස) | - | බුදුරදුන් විසින් ඇසුරු කරන ලද |
| භවාභවං | (නා) | - | භවයෙන් භවයට |
| විද්ධංසිනො | (කි) | - | විද්ධංසනය (නැසීම) කරන්නා වූ |
| කුසලත්ථිකානං | (ස) | - | කුසල් කැමැත්තවුන්ට |
| තමරියසඞ්ඝං | (සං) | - | (තං + අරියසඞ්ඝං) ඒ ආර්ය සංඝයා |
| ජීවලොකො | (ස) | - | ජීවලෝකයා |
| අවිජ්ජාදි | (සං) | - | අවිද්‍යාව ආදි |
| කිලෙසජාල | (ස) | - | කෙලෙස් දැල |

**අභ්‍යාස**

01. ''නමො මහාකාරුණිකස්ස තස්ස'' යටතේ ඇති ගාථා සිංහලට නගන්න.

02. පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. මහාකාරුණිකො කිත්තකං කාලං අතිදුක්කරානි අකාසි?
ii. නාථො කස්මා බෙදං ගතො?
iii. කස්මා ජීවලොකො භවාභවං ගච්ඡති?
iv. අරියසඞ්ඝා පන කස්ස පුත්තා හොන්ති?
v. අරියසාවකා කීදිසෙහි ගුණෙහි සමන්නාගතා භවන්ති?

03. ගාථා ඇසුරෙන් පිළිතුරු සපයන්න.

i. 'කප්ප' යන පදය විවරණය කරන්න.
ii. ඇඳිලි බැඳ නමස්කාර කිරීම යනු කුමක් ද?
iii. අවිද්‍යාව අන්ධකාරයකට සමාන කොට ඇත්තේ කුමක් හෙයින් ද?
iv. ත්‍රිශික්ෂා නම් කරන්න.
v. සංසරත්නය කෙතකට සමාන වන්නේ කෙසේ ද?

## අක්ෂර

'**අක්ෂර**' එනමින් හැඳින්වෙන්නේ අවසන් වීමක් හෝ ක්ෂය වීමක් නොවන හෙයින් බව සාම්ප්‍රදායික පිළිගැනීම යි. (**නක්ඛරන්තී'ති අක්ඛරා**) පාලි භාෂාවේ අකුරු **අක්ඛර, වණ්ණ, ව්‍යඤ්ජන** යන පදවලින් ද හඳුන්වනු ලබන අතර කච්චායන ව්‍යාකරණ සම්ප්‍රදායට අනුව පාලි භාෂාවේ අකුරු 41 කි. (**අක්ඛරාපාදයො එකචත්තාළීසං**) ඒවා ස්වර 08 කින් හා ව්‍යඤ්ජන 33 කින් සමන්විත වේ.

මොග්ගල්ලායන ව්‍යාකරණ සම්ප්‍රදායට අනුව වර්ණ (අකුරු) 43 කි. (**අආදයො තිතාළීස වණ්ණා**) '**එ**', '**ඔ**' ස්වර දෙක හ්‍රස්ව හා දීර්ඝ යන දෙවිධියෙන් ම පිළිගැනීම නිසා ස්වර 10 ක් වීම මීට හේතුව වේ. එහෙත් දීර්ඝ ලෙස උච්චාරණය කළ ද ලිවීමේ දී '**ඒ**', '**ඕ**' වශයෙන් දීර්ඝව ලිවීමක් සිදු නො වේ.

ඕනෑම භාෂාවක් නිවැරැදිව ලිවීමට හා උච්චාරණය කිරීමට හුරු පුරුදු වීම ඉතා වැදගත් ය. පාලි භාෂාව හැදෑරීමේ දී මෙය නිතර සිහි තබාගත යුතු වැදගත් කරුණකි. භාෂාවක මූලික ඒකකය අක්ෂර යි. අක්ෂර කීපයකින් පදයක් සෑදෙන අතර, පද කීපයකින් අර්ථවත් වාක්‍යයක් සෑදේ. පදයක අර්ථය නිවැරැදි ව හඳුනාගත හැකි වනුයේ අක්ෂර මගිනි. (**අත්ථො අක්ඛරසඤ්ඤාතො**) අක්ෂර නිවැරැදි ව නො යෙදුවහොත් අර්ථය වරදී. 'ශාස්තෘ' යන අර්ථය දැනවීමට '**සත්තා**' ලෙස ලියුවහොත් ඉන් අදහස් වනුයේ 'ශාස්තෘ' නොව 'සතුරා' හෝ 'සත්ත්වයෝ' යන්න යි.

සන්ධි, නාම, සමාස, තද්ධිත, කිතක, ආඛ්‍යාත ආදි ව්‍යාකරණාංග හැදෑරීමේ දී ද අක්ෂරාවබෝධය අත්‍යවශ්‍ය වේ. ඇතැම් විට පාලියේ තනි අක්ෂරය අර්ථවත් පදයක් වන අවස්ථා ද ඇත.

**උදා:- සා** (ඇය, සුනඛයා), **ක** (ජලය), **ජෙ** (බොල), **හො** (පින්වත), **මා** (එපා)

පාලි භාෂාවෙන් යමක් ලිවීමට භාවිත කරන සුවිශේෂ වූ සංකේත විශේෂයක් නොමැති බව ද සිහි තබා ගත යුතු ය. අප සිංහල අකුරෙන් පාලි හෝඩිය ලියා දක්වන අතර සියම්, බුරුම, ඉංග්‍රීසි, ජපන් ආදි රටවල වැසියෝ තම තමන්ගේ භාෂාවල අක්ෂරවලින් පාලි හෝඩිය ලියනු ලැබේ.

**පාලි අක්ෂර මාලාව**

ස්වර - 08

**අ, ආ, ඉ. ඊ, උ, ඌ, එ, ඔ**

ව්‍යඤ්ජන - 33

**ක, ඛ, ග, ඝ, ඞ,**
**ච, ඡ, ජ, ඣ, ඤ,**
**ට, ඨ, ඩ, ඪ, ණ,**
**ත, ථ, ද, ධ, න**
**ප, ඵ, බ, භ, ම,**
**ය, ර, ල, ව,**
**ස, හ, ළ,**
**(අ)ං**

ස්වර

තමා ම බැබළේ යන අදහසින් ස්වර නම් වේ. (**සයං රාජෙන්තී'ති සරා**) එසේ ම ව්‍යඤ්ජනාක්ෂරයන් උසුරුවීමට ආධාර වන හෙයින් ද ස්වර නම් වේ. (**ව්‍යඤ්ජනෙ සාරාපෙන්තී'ති සරා**)

ස්වර අට අතුරින් තුනක් (අ, ඉ, උ) හ්‍රස්ව වන අතර, ඉතිරි ඒවා දීර්ඝ ස්වර වේ. (**ආ, ඊ, ඌ, එ, ඔ**)

- සංයෝගයකට මුලින් ඇති 'එ', 'ඔ' දෙක හ්‍රස්වව උච්චාරණය වේ.

උදා:- **එත්ථ, සෙය්‍යථීදං, ඔට්ඨො, සොත්ථි**

- සංයෝගයක් නැති විට දීර්ඝව උච්චාරණය වේ.

  **උදා:- එවං, එකං, සොතං, ඔදනං, දෙවො**

- 'එ', 'ඔ' අකුරු දෙක අසවර්ණ නම් වේ.

**ව්‍යඤ්ජන**

ව්‍යක්ත අර්ථ දැනවීමෙහි සමත් අකුරු '**ව්‍යඤ්ජන**' නම් වේ. (**ව්‍යඤ්ජයති අත්‍ථො එතෙහී'ති ව්‍යඤ්ජනා**)

**වර්ගාක්ෂර**

පහත දැක්වෙන පරිදි 'ක' සිට 'ම' දක්වා පහ පහ බැගින් ඇති අකුරු 25 වර්ගාක්ෂර නම් වේ. (**බ්‍යඤ්ජනානං කාදයො මකාරන්තා පඤ්ච පඤ්චසො අක්ඛරවන්තො වග්ගා**)

| | | |
|---|---|---|
| 'ක' වග්ග | - | ක, ඛ, ග, ඝ, ඞ |
| 'ච' වග්ග | - | ච, ඡ, ජ, ඣ, ඤ |
| 'ට' වග්ග | - | ට. ඨ, ඩ, ඪ, ණ |
| 'ත' වග්ග | - | ත, ථ, ද, ධ, න |
| 'ප' වග්ග | - | ප, ඵ, බ, භ, ම |

මේවා අක්ෂර උපදින ස්ථානවල හා දිව මැද මැනවින් ස්පර්ශ වන හෙයින් '**ස්පර්ශාක්ෂර**' ලෙස ද නම් කෙරේ.

අනෙක් අක්ෂර '**ක**' වර්ග, '**ච**' වර්ග ආදි ලෙස කිසියම් වර්ගයකට නොවැටෙන හෙයින් '**අවර්ගාක්ෂර**' නම් වේ.

**අඝෝෂාක්ෂර**

වර්ගයන්ගේ පළමු දෙවන අකුරු 10 ද 'ස' කාරය ද අඝෝෂ නම් වේ. (**වග්ගානං පඨමදුතියා සො චාඝොසා**)

**ක, ඛ, ච, ඡ, ට, ඨ, ත, ථ, ප, ඵ, ස**

**ඝෝෂාක්ෂර**

අඝෝෂ අකුරු 11 හා නිග්ගහීතය හැර 'ළ'කාරය අන්ත කොට ඇති ඉතිරි අකුරු 21 ඝෝෂාක්ෂර වේ. **(ළන්තා සෙසා ඝොසා)**

**ග, ඝ, ඞ, ජ, ඣ, ඤ, ඩ, ඪ, ණ, ද, ධ, න, බ, භ, ම, ය, ර, ල, ව, හ, ළ**

**නිග්ගහීත**


'(අ)ං' බින්දුව නිග්ගහීතය ලෙස හැඳින්වේ. මුල්කාලයේ අකුරු උඩින් බිංදුව ලියන ලද බැවින් සිළුමිණක ආකාරය උසුලන අතර තනිව උසුරුවිය නොහැකි බැවින් ඊට මුලින් 'අ' කාරයක් යොදා කියනු ලැබේ.

**බින්දු චූළාමණාකාරො - නිග්ගහීතන්ති වුච්චතෙ**
**කෙවලස්සාප්පයොගත්තා - අකාරො සන්නිධීයතෙ**

**අන්තඃස්ථාක්ෂර**

**ය, ර, ල, ව** යන අකුරු 04 ස්වර ස්වභාවයත්, ව්‍යඤ්ජන ස්වභාවයත් අතර පවතින හෙයින් මෙනමින් හැඳින් වේ. මේවා **ද්වියාක්ෂර** ලෙස ද, අක්ෂර උත්පත්ති ස්ථානවල සම්පූර්ණයෙන් ස්පර්ශ නොවන හෙයින් **ඊසම්ඵුට්ඨ** ලෙස ද හැඳින් වේ.

**අක්ෂර උත්පත්ති ස්ථාන**



## අක්ෂරයන්ගේ ප්‍රභේද

| | | | | |
|---|---|---|---|---|
| ස්වර | හ්‍රස්ව ස්වර | අ, ඉ, උ (ලහුමත්තා තයො රස්සා) | අඝෝෂ | ක, ඛ, ච, ඡ, ට, ඨ, ත, ථ,ප, ඵ, ස (වග්ගානං පඨමදුතියා සො චාඝොසා) |
| | දීර්ඝ ස්වර | ආ, ඊ, ඌ, ඒ, ඕ (අඤ්ඤෙ දීඝා) | | |
| වර්ගාක්ෂර | | ක, ඛ, ග, ඝ, ඞ<br>ච, ඡ, ජ, ඣ, ඤ<br>ට. ඨ, ඩ, ඪ, ණ<br>ත, ථ, ද, ධ, න<br>ප, ඵ, බ, භ, ම<br>(වග්ගා පඤ්ච පඤ්චසො මන්තා) | ඝෝෂ | ග, ඝ, ඞ, ජ, ඣ, ඤ, ඩ, ඪ, ණ, ද, ධ, න, බ, භ, ම, ය, ර, ල, ව, හ, ළ,<br>(ළන්තාඤ්ඤෙ ඝොසා) |
| අවර්ගාක්ෂර | | ය, ර, ල, ව, ස, හ, ළ, (අ)ං | නිග්ගහීත | (අ)ං<br>(අං ඉති නිග්ගහීතං) |
| අන්තස්ථාක්ෂර | | ය, ර, ල, ව | අල්පප්‍රාණ | ක, ග, ච, ජ, ට, ඩ, ත, ද, ප, බ, |
| ඌෂ්මාක්ෂර | | ස, හ | මහාප්‍රාණ | ඛ, ඝ, ඡ, ඣ, ඨ, ඪ, ථ, ධ, ඵ, භ, |

**අභ්‍යාස**

01. සිංහලට නඟන්න.

i. අකාරාදයො නිග්ගහීතන්තා එකචත්තාළීසක්ඛරා භවන්ති.
ii. එකො මනුස්සො අක්ඛරානි දිස්වා 'කිං හො ඉද'න්ති අක්ඛරඤ්ඤුං මනුස්සං පක්කොසාපෙත්වා දස්සෙසි.
iii. යො නිරුත්තිං න ජානාති - ජානාති පිටකත්තයං
පදෙ පදෙ විකඞ්ඛෙය්‍ය - වනෙ අන්ධගජො විය.
iv. අක්ඛරචින්තකා (ව්‍යාකරණඥයෝ) සුග්ගහිතසුත්තා නං අත්ථඤ්ච පාළිඤ්ච පටිබුජ්ඣන්ති.
v. ඉදානි පන මුද්දිතපොත්ථකානං සුලභතාය තාලපණ්ණෙසු ලිඛන්තා දුල්ලභා හොන්ති.



නොමිලේ බෙදා හැරීම පිණිසයි

02. පාලියට නඟන්න.

i. සාමණේර තෙමේ පෑන (අක්ඛරචඤ්චු) ගෙන පොතෙහි අකුරු ලියා ගුරුවරයාට පෙන්වීය.
ii. පාලි භාෂාවේ ව්‍යඤ්ජනාක්ෂරයෝ තිස්තුනක් වෙති.
iii. ඇතමෙක් බිංදුවට නිග්ගහීත යැයි කියත්.
iv. පුස්කොළ පොත්වල අකුරු රටා 03ක් දක්නට ලැබේ.
v. මුගලන් ඇදුරෝ අකුරුවලට වර්ණ යැයි ව්‍යවහාර කරත්.

03. අර්ථවත් ඒකාක්ෂර පද 20ක් ලියන්න.

04. හිස්තැන් පුරවන්න.

| අක්ෂර | උපදින ස්ථානය | බාලාවතාර සූත්‍ර පාඨය |
|---|---|---|
| ව | දත් සහ තොල් | වො දන්තොට්ඨජො |
| ඉ, ජ | | |
| ග, හ, | | |
| උ, එ | | |
| ල, ස | | |
| ට, ළ | | |

05. පහත දැක්වෙන පදවල අක්ෂර වින්‍යාසය නිවැරැදි කොට ලියන්න.

i. අඤ්ඤනො
ii. අට්ටාරස
iii. විශෙෂං
iv. මා නිවත්ථ
v. අජ්ජබාසි
vi. නිබ්භත්තති
vii. පුරිසධම්මසාරථී
viii. චත්තාලීසති
ix. උච්ඡාරණ
x. සම්බත්තං